Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3 සේවා ගණයේ III වන ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු හා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරුවල පුරප්පාඩු සීමිත පදනමින් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3 සේවා ගණයට අයත් III ශ්‍රේණියේ පෙර මුද්‍රණ සැලසුම්කරු හා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරුවල පුරප්පාඩු සීමිත පදනමින් පිරවීම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරුවල පුරප්පාඩු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| පෙර මුද්‍රණ සැලසුම්කරු | - | 02 |
| ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | - | 01 |

02. *තනතුරේ ස්වභාවය :*
ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.)

03. *තනතුරට අදාළ වැටුප් කේතය සහ වැටුප් පරිමාණය :*
3.1 වැටුප් කේතය : MT 01 - 2016
3.2 වැටුප් පරිමාණය : රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890/- ක මාසික වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමි වේ.

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව අදාළ තනතුරට පත් කිරීමේ දී ගෙවන වැටුප තීරණය වේ.

04. තනතුරුවලට පැවරෙන කාර්යයන් ඃ

*පෙර මුද්‍රණ සැලසුම්කරු ඃ*

- පිටු ලේ-අවුට් කිරීම
- ප්‍රොසෙස් කැමරා වැඩ
- ඡායාපටල යොදා සැලසුම් කිරීම හා පිටු ලේ-අවුට් කිරීම
- රිප් කිරීම
- ඉමේජ් සෙටින් කිරීම
- ප්ලේට් සෑදීම
- පොලිමර් ප්ලේට් සෑදීම
- ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම.

*ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු ඃ*

- ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම
- වර්ණ සහ කළු සුදු පිටපත් ලබාගැනීම.

05. බඳවා ගැනීමේ සුදුසුකම් ඃ

5.1 *අධ්‍යාපන සුදුසුකම්.-* සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

5.2 *වෘත්තීය සුදුසුකම්* ඃ අදළ නැත

5.3 *පළපුරුද්ද* ඃ පෙර මුද්‍රණ සැලසුම්කරු ඃ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශයේ වසර දහය (10)කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කැමරා ක්‍රියාකරු, තහඩු සාදන්නා, ටයිප් සෙටර් තනතුරේ නිලධාරියෙකු වීම.

ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු ඃ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශයේ වසර දහය (10)කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු සහ යන්ත්‍ර පරිවාරක තනතුරේ නිලධාරියෙකු වීම;

සහ

පිළිගත් ආයතනයක ලිතෝ යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳ මාස හය (06)කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

5.4 කායික සුදුසුකම් ඃ සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසුකම් ඃ

1. පත්වීම ස්ථිරකර තිබිය යුතුය.
2. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත අයදුම්කරුවන් විය යුතු ය.
4. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර (05) ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
5. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන* ඃ

තනතුරට ලබා ඇති පළපුරුද්ද හා සුදුසුකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

5.6 වයස ඃ අදල නොවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය ඃ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙලින් එක් එක් තනතුරට පත් කරනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය ඇමුණුම 2 මගින් දැක්වේ.

07. අයදුම්පත් මෙම දැන්වීම සමග ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව සකස් කර නිවැරදි ලෙස සම්පූර්ණ කර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.09.28 දිනට හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අංක 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල" යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

08. අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, එදිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන අවසන් තීරණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

අයි. ආර්. බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ඇමුණුම 2

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 3 සේවා ගණයේ III වන ශ්‍රේණියේ
පෙර මුද්‍රණ සැලසුම්කරු, මුද්‍රණ කාර්මික හා මුද්‍රණ නිමැවුම්කරු තනතුරුවලට
සීමිත බඳවා ගැනීම යටතේ බඳවා ගැනීම

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු පරිපාටිය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 10 |
| අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් නම්, | ලකුණු 05ක් | |
| අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් නම්, | | |
| විශිෂ්ට සාමාර්ථයක් හෝ අධි සම්මාන සාමාර්ථයක් (A/B/D) සඳහා | ලකුණු 05ක් | |
| සම්මාන සාමාර්ථයක් (C) සඳහා | ලකුණු 03ක් | |
| සාමාන්‍ය සාමාර්ථයක් (S) සඳහා | ලකුණු 01ක් | |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් (උපරිම සහතික 05ක් සලකා බලනු ලැබේ.) | | 25 |
| **පෙර මුද්‍රණ සැලසුම්කරු** | | |
| පිළිගත් ආයතනයක පෙර මුද්‍රණ ශිල්පය සම්බන්ධයෙන් හදාරා ඇති, | | |
| මාස 03කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 05ක් | |
| මාස 02කට අඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 03ක් | |
| සතියකට අඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 01ක් | |
| **ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු** | | |
| පිළිගත් ආයතනයක ලිතෝ මුද්‍රණ ශිල්පය සම්බන්ධයෙන් හදාරා ඇති, | | |
| මාස 12කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 05ක් | |
| මාස 06කට නොඅඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 03ක් | |
| මාස 03කට අඩු පුහුණු පාඨමාලාවක් සඳහා | ලකුණු 01ක් | |

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 3. අතිරේක පළපුරුද්ද<br><br>(මූලික සුදුසුකම් යටතේ වන පළපුරුද්දට අමතර පළපුරුද්ද සඳහා පූර්ණ වසරකට ලකුණු 03 බැගින් උපරිම වසර 20ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)<br><br>**පෙර මුද්‍රණ සැලසුම්කරු**<br>පෙර මුද්‍රණ ශිල්පයට අදාළ තනතුරක පළපුරුද්ද සඳහා ලකුණු 60ක්<br><br>**ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු**<br>ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ ශිල්පයට අදාළ තනතුරක පළපුරුද්ද සඳහා ලකුණු 60ක් | 60 |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| 5. එකතුව | 100 |

අයි. ආර්. බණ්ඩාර,<br>
අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*)<br>
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 3 සේවා ගණයේ III වන ශ්‍රේණියේ
පෙර මුද්‍රණ සැලසුම්කරු හා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරුවලට
සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමග නම :————.

   සිංහලෙන් :————.

   ඉංග්‍රීසියෙන් :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
5. 2018.09.28 දිනට වයස ඃ අවු. :————. මාස :————. දින :————.
6. ස්ත්‍රී පුරුෂ භාවය :————.
7. විවාහක/අවිවාහක බව :————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————.
9. දුරකතන අංකය :————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

11. *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා.පෙළ)

විභාග අංකය :————. පෙනී සිටි වසර :————.

I. ————. VI. ————.
II. ————. VII. ————.
III. ————. VIII. ————.
IV. ————. IX. ————.
V. ————. X. ————.

අ. පො. ස. (උ. පෙළ)

විභාග අංකය :————. පෙනී සිටි වසර :————.

I. ————. III. ————.
II. ————. IV. ————.

12. *වෘත්තීය සුදුසුකම් :*

| පාඨමාලාවේ නම | ආයතනය | NVQ මට්ටම | කාලසීමාව | වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

13. *පළපුරුද්ද :*

| ආයතනය | සේවා කාලය |
|---|---|
| | |
| | |

14. *වෙනත් සුදුසුකම් :*

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සෙකු නොවන බව ද, තනතුරෙන් ඉවත් වීමට සිදු වන බව ද මා හොඳාකාරවම දන්නා බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහතින් අත්සන් කර ඇති ..........................................................................මයා./මිය./මෙය. මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි.

________,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය : ..................................................................
නම : ..................................................................
තනතුර : ..................................................................
ලිපිනය : ..................................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

16. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඉහත 1 සිට 14 දක්වා වූ තොරතුරු නිවැරදි බව ත්, මෙම නිලධාරියා/නිලධාරිනිය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බව ත් සහතික කරමි. තව ද මෙම නිලධාරියා/නිලධාරිනිය මෙම තනතුර සඳහා තේරී පත් වුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/ නොහැකිය.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ..................................................................
නම : ..................................................................
තනතුර : ..................................................................
ලිපිනය : ..................................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)